ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2277/38 – 2022 අප්‍රේල් 27 වැනි බදාදා – 2022.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/Z/2016/15.

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.06.16 දිනැති හා අංක 2023/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.06.06 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. රත්නපුර, කුරුවිට, කාහේන්ගම, අංක 198/15 හි පදිංචි ඩබ්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මහතා, 2. කටුගස්තොට, කොන්ඩදෙනිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ස්ථානභාර නිලධාරි නිලනිවාස, අංක. 01 හි පදිංචි යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මහතා, 3. රත්නපුර, නව නගරය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (සබරගමුව), ජේ. ඒ. එන්. බී. ජයසූරිය මහතා, 4. මාතලේ, ඔය පහල, ජලපවිත්‍රාගාරය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වැඩභාර නිලධාරි, ජේ. එම්. ටී. එන්. බී. ජයසිංහ මහතා 5. මාතලේ, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය, ඉංජිනේරු සහකාර (සිවිල්), කේ. එම්. ටී. තරංගනී මහත්මිය සහ රත්මලාන, ගාලු පාර හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.02.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 36691 – 18 (2022/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/COM/05/Z/2016/15.

කාර්මික අධිකරණයේ දී ය

1. ඩබ්ලිව්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මහතා,
අංක 198/15,
කාහේන්ගම,
කුරුවිට,
රත්නපුර.

2. යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මහතා,
අංක. 01,
ස්ථානභාර නිලධාරී නිල නිවාස,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
කොන්ඩදෙනිය,
කටුගස්තොට.

3. ජේ. ඒ. එන්. බී. ජයසූරිය මහතා,
ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (සබරගමුව),
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
නව නගරය,
රත්නපුර.

4. ජේ. එම්. ටී. එන්. බී. ජයසිංහ මහතා,
වැඩභාර නිලධාරී,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ජලපවිත්‍රාගාරය, ඔයපහල,
මාතලේ.

5. කේ. එම්. ටී. තරංගනී මහත්මිය,
ඉංජිනේරු සහකාර (සිවිල්),
දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
මාතලේ.

පළමුවැනි පාර්ශවය

නඩු අංකය: A/20/201/7

සහ,

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ගාළු පාර,
රත්මලාන.

දෙවැනි පාර්ශවය

අතර පවතින ආරවුල.

ප්‍රදානය

කම්කරු හා වෘත්තිය සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් කම්කරු හා වෘත්තිය සබඳතා අමාත්‍යවරයා වශයෙන් එතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2017.06.06 දිනැති නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරවුලට හේතු වී ඇති කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ ඃ

''ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවයේ නියුතු ඩබ්ලිව්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මයා, යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මයා, ජේ. ඒ. එන්. බී. ජයසූරිය මයා, ජේ. එම්. ටී. එන්. බී. ජයසිංහ මයා සහ කේ. එම්. ටී. තරංගනී මිය යන ඉංජිනේරු සහකාරවරුන් පස් දෙනාට තමන්ගේ පත්වීම් ලිපියේ 03 වන වගන්තිය ප්‍රකාරව පෙර සේවා කාලයන් පදනම් කරගෙන වැටුප් වර්ධක ලබාදෙන බවට ලිඛිතව දන්වා ඇතත්, වැටුප් තලයේ පිහිටුවීම හා හිඟ වැටුප් නොගෙවා තිබියදී ඉංජිනේරු සහකාර එල්. එම්. අයි. යූ. සිල්වා නැමැති අයට පමණක් වැටුප් තලයේ පිහිටුවා හිඟ වැටුප් ගෙවා තිබීම මගින් ඉල්ලුම්කැරුවන් හට යම් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

බේරුම්කරණ විභාග පටිපාටිය

බේරුම්කරණ විභාග පටිපාටියට අනුව පළමුවැනි සහ දෙවැනි පාර්ශවයන් ස්වකීය ස්ථාවරයන් දක්වෙන පළමුවැනි ප්‍රකාශයන් සහ දෙවැනි ප්‍රකාශයන් කාර්මික අධිකරණය වෙත භාර දෙනු ලැබුණි. එකී පළමු සහ දෙවැනි ප්‍රකාශ දෙපාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු 2018.03.02, 2018.04.27, 2018.06.12, 2018.07.16, 2018.08.21, 2018.10.09, 2018.11.13, 2019.02.21, 2019.03.25 සහ 2019.06.10 යන දිනයන්හි දී මා විසින් බේරුම්කරණ විභාගය පවත්වා අවසන් කරන ලදී. පරීක්ෂණය සඳහා දින නියම කරන ලැබූ නමුත් 2017.11.20, 2018.03.23, 2018.09.13, 2019.01.17 සහ 2019.05.06 යන දිනයන්හි දී විවිධ හේතූන් නිසා බේරුම්කරණ විභාගය පැවැත්වීමට නොහැකි වූ බව ද සටහන් කරමි.

සහනය පතන ඉංජිනේරු සහකාරවරුන් අතුරෙන් ඩබ්ලිව්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මහතා සහ යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මයා බේරුම්කරණ විභාගය පැවැත්වුණු සෑම දිනක ම සහභාගි වූ අතර, කේ. එම්. ටී. තරංගනී මිය සහභාගි වූයේ 2018.06.12 වැනි දින දී පමණි. අනෙක් දෙදෙනා පරීක්ෂණය පැවැත්වුණු ඇතැම් දිනයන්හි දී සහභාගි වූහ. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් පස් දෙනා ම වෙනුවෙන් බලය පවරන ලද නියෝජිත ඊ. ඩබ්ලිව්. ශ්‍රේෂන් මහතා විභාගය පැවැත්වුණු සෑම දිනක ම පෙනී සිටියේ ය. දෙවැනි පාර්ශ්වයේ සේවායෝජක ආයතනයේ මානව සම්පත් නිලධාරිනී ගීතානි සමිතා ජයගොඩ මහත්මිය විභාගය පැවති සෑම දිනක මත්, නීති නිලධාරිනී සිතාරා තැඹිලියාගොඩ මහත්මිය දින නවයක දීත්, දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් සහභාගී වූහ. ආයතනය වෙනුවෙන් රජයේ නීතිඥ සජිත් බණ්ඩාර මහතාත්, රජයේ නීතිඥ හේෂානි කලුබෝවිල මහත්මියත්, රජයේ නීතිඥ සාලින්ද කුරියන් මහතාත් වරින්වර පෙනී සිටියහ.

බේරුම්කරණ විභාගය ආරම්භ වීමට පෙර, මෙම යොමුව සම්බන්ධ මූලික විරෝධතාවක් ගෙන එමින් දෙවැනි පාර්ශ්වය නියෝජනය කළ රජයේ නීතිඥවරිය මෙම බේරුම්කරණ විභාගය පවත්වාගෙන යාමට ඉඩක් නොමැති බවට වාචික සැළකිරීමක් කරන ලදී. පළමුවැනි පාර්ශ්වයේ ලිඛිත පිළිතුරු ද සැළකිල්ලට ගෙන බේරුම්කරණ විභාගය අඛණ්ඩ ව පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

අනතුරු ව බේරුම්කරණ විභාගයේ දී හබයකින් තොරව පළමුවැනි පාර්ශ්වය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර, එම පාර්ශ්වය වෙනුවෙන් සහනය පතන පස්දෙනා අතුරින් යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න යන අයගේ සාක්ෂිය පමණක් මෙහෙයවන ලදී. බේරුම්කරණයේ අවසරය ඇති ව ඔහුගේ මූලික සාක්ෂිය ඇමුණුම් 08 ක් සහිත ව පිටු 04කින් යුක්ත දිවුරුම් පෙත්සමක් මාර්ගයෙන් 2018.07.16 දින ඉදිරිපත් කෙරුණි. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ද ආයතනයේ අතිරේක සාමාන්‍යාධිකාරී ගැමුණු කුමාර ඉද්දමල්ගොඩ යන අයගේ වාචික සාක්ෂිය පමණක් මෙහෙයවන ලදී.

මෙම පරීක්ෂණයේ දී පළමුවැනි පාර්ශ්වය විසින් A1 සිට A 8 දක්වා (එකී ලේඛන බේරුම්කරණයේ දී ඉදිරිපත් වී ඇත්තේ පළමුවැනි පාර්ශ්වයේ සාක්ෂිකරුගේ දිවුරුම් පෙත්සම් සාක්ෂියේ ඇමුණුම් වශයෙන් ගොනු කිරීමෙනි) ද, දෙවැනි පාර්ශ්වය විසින් R1 සිට R 19 දක්වා ද ලේඛන, අතුරු ලේඛන ද සමග ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

පසුබිම

එවකට ජලසම්පාදන සහ ජලාපවහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවක ශ්‍රේණි X ට අයත් වන ඉංජිනේරු සහකාර (සිවිල්/ යාන්ත්‍රික) තනතුර ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියට ඇතුළත් තනතුරක් වන අතර, 2011.06.01 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවා ඇති "අනුමත කාර්ය මණ්ඩලයේ" සේවක සංඛ්‍යාවට (Approved cadre) තනතුරු 700ක් ඇතුළත් විය. එම තනතුර MA 2-2 වැටුප් කාණ්ඩයට අයත් වේ. ආයතනයේ එකී තනතුරේ පැවති පුරප්පාඩු පිරවීමට 2011.04.10 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් පළ කරනු ලැබ ඇත. අයදුම් කරන ලද අයදුම් කරුවන් නිසි බඳවා ගැනීමේ ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් පසු ඉංජිනේරු සහකාර (සිවිල්) තනතුරට 100 දෙනෙකු ද, ඉංජිනේරු සහකාර (විදුලි) තනතුරට 10 දෙනෙකු ද බඳවා ගනු ලැබ ඇත. මෙහි පළමුවැනි පාර්ශ්වයේ සහනය පතන,

1. ඩබ්ලිව්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මහතා,
2. යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මහතා,
3. ජේ. ඒ. එන්. බී. ජයසූරිය මහතා,
4. ජේ. එම්. ටී. එන්. බී. ජයසිංහ මහතා, සහ
5. කේ. එම්. ටී. තරංගනී මහත්මිය

යන අයවලුන් පස් දෙනා ද ඇතුළත් විය.

එකී පස්දෙනා මණ්ඩලයේ සේවයට බඳවා ගනු ලැබූ අතර, බඳවා ගත් වහාම ජයරත්න, ජයසිංහ සහ ජයසූරිය යන අයට "ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) III පංතිය තනතුරට පත් කිරීම" යන හිසින් ද; වැල්අරඹ සහ තරංගනී යන අයට "ඉංජිනේරු සහකාර (සිවිල්) III පංතිය තනතුරට පත්කිරීම" යන හිසින් යුතු ව 2012 වර්ෂයේ අප්‍රේල් මස 16 දිනත්, මැයි මස 28 දිනත් අතර කාලය තුළ පත්වීම් ලිපි නිකුත් කරනු ලැබ ඇත.

එම ලිපි වල 08 වැනි ඡේදයේ "ඔබ පත්වීම භාර ගැනීමෙන් පසු පත්වීමේ ලිපියක් නිකුත් කරනු ලැබේ" යනුවෙන් වෙතත්, සේවයට බඳවා ගනිමින් නිකුත් කළ ඉහත කී මුල් පත්වීමේ ලිපියේ ද (මෙම ප්‍රදානයේ දී මෙම පත්වීම් ලිපි "පළමුවැනි පත්වීමේ ලිපිය" ලෙස හඳුන්වනු ලැබේ.) සේවා කොන්දේසි හා සේවා තත්වයන් ගණනාවක් ඇතුළත් කොට ඇත.

මෙම පළමුවැනි පත්වීම් ලිපි නිකුත් කිරීමෙන් මාස ගණනකට පසු ව "පත්වීමේ ලිපිය" යන හිසින් යුතු ව 'ආයතනය විසින් විධිමත් පත්වීම් ලිපියක්' යයි හඳුන්වනු ලබන තවත් පත්වීම් ලිපියක් ද (මෙම ප්‍රදානයේ දී එකී පත්වීම් ලිපි "දෙවැනි පත්වීමේ ලිපිය" ලෙස හඳුන්වනු ලැබේ.) ඔවුන්ට නිකුත් කර ඇත. එකී දෙවැනි පත්වීම් ලිපියේ ද විස්තරාත්මක ව සේවා කොන්දේසි හා සේවා තත්වයන් ගණනාවක් ඇතුළත් කොට ඇත.

පරිවාස කාලය අවසානයේ මෙකී පස් දෙනා සේවයේ ස්ථිර කිරීම විවිධ කාල පරාසයන් තුල සිදු ව ඇත. මෙම ලිපි බඳවා ගත් සියලුම ඉංජිනේරු සහකාර වරුන්ට එකම ආකාරයකින් යුතුව පොදුවේ නිකුත් කර ඇති ඒවාය. මෙම බේරුම්කරණය විභාගයට අදල කාර්මික අවුල උපචිත වී ඇත්තේ ඉහත කී අයුරින් නිකුත් කරනු ලැබ ඇති "ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) III පංතිය තනතුරට පත් කිරීම" සහ "ඉංජිනේරු සහකාර (සිවිල්) III පංතිය තනතුරට පත් කිරීම" යන හිසින් යුතු ව නිකුත් කළ පළමුවැනි පත්වීම් ලිපිවල 03 වැනි ඡේදයේ අඩංගු

"03. .... මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව ඔබ අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක සේවය කර තිබේ නම් එහි සේවා සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සුදුසු ඉහළ වැටුප් පියවරක තැබීමට මණ්ඩලයේ නීති රීති අනුව පසුව සලකා බලනු ඇත."

යන සේවා කොන්දේසිය ආයතනයේ පාලනාධිකාරිය විසින් සපුරාලීමට සමත් නොවීමෙන් සහනය පතන ඉංජිනේරු සහකාරවරුන්ගේ සේවක අයිතීන් උල්ලංඝනය වීමෙන් බවට පළමුවැනි පාර්ශවයෙන් කරුණු ඉදිරිපත් විය. එකී සේවා කොන්දේසිය යටතේ තමන්ට හිමි විය යුතු වැටුප් වර්ධක වාසිය තමන්ට නොලැබුනත්, එල්. එම්. යූ. අයි. සිල්වා නමැති තමන් සමග ම එකම දිනයේ දී, එකම බඳවාගැනීමේ ක්‍රියාවලියට භාජනය වී, සමාන ම පත්වීමක් ලැබූ ඉංජිනේරු සහකාරවරයාට ලබා දී ඇත. ඉංජිනේරු සහකාර එල්. එම්. යූ. අයි. සිල්වා මහතා ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලයට පත්වීමට පෙර වෙනත් පිළිගත් ආයතනවල සේවය කළ සේවාකාලය සැළකිල්ලට ගෙන ඉහළ වැටුප් තලයක පිහිටුවා ආරම්භයේ සිට ම වැටුප් වර්ධක 8ක වාසියක් ලබා දී තිබීමෙන් මෙය තමන්ට ද ලබා දිය යුතු, එහෙත් ලබා නුදුන් අයිතිවාසිකමක් ලෙස පළමුවැනි පාර්ශවය පෙන්වා දුන්නේ ය. එකී සිල්වා යන අයට ගෙවා තිබුණු එකී වැඩිපුර ගෙවීම වැරදීමකින් ගෙවන ලද්දක් යයි මෙම බේරුම්කරණ විභාගය ආරම්භ වීමෙන් පසුව තීරණය කොට ආපසු අයකරගැනීමට ආයතනයේ පාලනාධිකාරිය පියවර ගෙන ඇත.

පළමුවැනි පාර්ශවයේ ස්ථාවරය

- පළමුවැනි පාර්ශ්වයේ සහාය පතන පස්දෙනා ම වෙත ඔවුන් බඳවා ගන්නා අවස්ථාවේ නිකුත්කළ පත්වීම් ලිපියේ 03 වැනි කොන්දේසිය ඉතා පැහැදිලි සේවා කොන්දේසියකි. එකී 3 වැනි කොන්දේසිය පසුව නිකුත් කරන ලද පත්වීමේ ලිපිය මගින් සංශෝධනය කිරීමක් හෝ අවලංගු කිරීමක් කර නැති බව.

- ඔවුන් බඳවා ගැනීමේ දී ක්‍රියාත්මක වූයේ 1991 සිට ම ක්‍රියාත්මක වෙමින් පැවති බඳවා ගැනීමේ පටිපාටිය බව.

- ඔවුන් සමග ම ඉංජිනේරු සහකාරවරයෙකු වශයෙන් බඳවා ගනු ලැබූ එල්. එම්. යූ. අයි. සිල්වා මහතාට පත්වීම් ලිපියේ 03 වැනි කොන්දේසිය මත පූර්ව සේවා කාලයට අදාල ව වැටුප් වර්ධක ගෙවා ඇති අතර, එම ගෙවීම ඔහුට කර ඇත්තේ නිවැරදි කරුණු මත බව සහ ඒ අනුව තමන්ටත් එම වැටුප් වර්ධක ප්‍රතිලාභය හිමි විය යුතු බව.

දෙවැනි පාර්ශවයේ ස්ථාවරය

- අනෙකුත් කරුණු අතර තම වාසියට දෙවැනි පාර්ශ්වය පහත සඳහන් කරනු ඉදිරිපත් කළේ ය. මෙම ඉංජිනේරු සහකාරවරුන් පත්කරන අවස්ථාවේ දී ඔවුන්ට ලබාදුන් තාවකාලික පත්වීමේ ලිපියෙහි (පළමුවැනි පත්වීමේ ලිපිය) පමණක් පහත දැක්වෙන ප්‍රශ්නගත කොන්දේසිය ඇතුළත් වන බව :

"03. ....මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව ඔබ අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක සේවය කර තිබේ නම් එහි සේවා සහතික ඉදිරිපත් කිරීමෙන් පසු සුදුසු ඉහළ වැටුප් පියවරක තැබීමට මණ්ඩලයේ නීති රීති අනුව පසුව සළකා බලනු ඇත."

ඉන්පසුව ඔවුන් වෙත නිකුත් කර ඇති විධිමත් පත්වීමේ ලිපියේ (දෙවැනි පත්වීමේ ලිපිය) මෙම කොන්දේසිය ඇතුළත් නොවේ. එම විධිමත් පත්වීමේ ලිපියේ කොන්දේසි මත පත්වීම් භාරගන්නා බවට එකී දෙවැනි පත්වීමේ ලිපිය මෙම සේවක පිරිස් විසින් අත්සන් කොට දී පත්වීම් භාරගෙන ඇත.

- වැටුප් වර්ධක ලබා ගැනීම අයිතියක් නොව සේවකයා විසින් උපයා ගත යුත්තකි. බලාන්විත වන්නේ දෙවැනි වරට දුන් පත්වීම් ලිපිය බැවින් තාවකාලික පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසියක් පදනම් කරගෙන ආයතනයේ සේවයට පැමිණීමට පෙර කරන ලද සේවය සලකා වැටුප් වර්ධක ලබාදිය නොහැකි ය.

- 2006 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නිකුත් කළ අංක 30 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර ව 2008 වර්ෂයේ සිට ආයතනයේ ප්‍රතිව්‍යුහගතකිරීමේ ක්‍රියාවලිය සිදුවිය. එකී අංක 30 දරන චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කර ඇති ලිපිවලින් මෙම ගෙවීම් කිරීමට ඉඩක් නොලැබේ. කළමනාකරණ සේවා අංක 30 චක්‍රලේඛය ක්‍රියාත්මක වීමෙන් පසු ව පළමුවැනි පාර්ශවයේ ඉල්ලුම්කරුවන් පස් දෙනා ඇතුළු 110 ක් පමණ දෙනා දහවැනි (x) මාණ්ඩලික ශ්‍රේණියේ ආරම්භක වැටුප් තලය වෙනුවට නවවැනි (ix) මාණ්ඩලික ශ්‍රේණියේ ආරම්භක වැටුප් තලයට ඉහළ දමා ඇත.

- 2012 වර්ෂයේ දී බඳවාගත් මෙකී ඉංජිනේරු සහකාරවරුන් 110 දෙනා අතුරින් එල්. එම්. යූ. අයි. සිල්වා නැමැති අයට පමණක් මෙම කොන්දේසිය පදනම් කරගෙන වැටුප් වර්ධක අටක් පිරිනමා ඇත්තේ ප්‍රමාද දෝෂයකින් ය. එම වරද අනාවරණය වූ වහාම වැඩිපුර ගෙවා ඇති මුදල් කොටස් වශයෙන් ඔහුගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත. එමනිසා මේ වන විට මෙම කාරණයට අදාල ව කාර්මික ආරවුලක් නොපවතී.

- මෙම ගෙවීම කිරීමට සිදු වුවහොත් රාජ්‍ය සංස්ථාවක් වන සේවා යෝජක ආයතනයට විශාල වැය බරක් දරන්නට සිදුවන අතර වැටුප් විෂමතාවන් ද ඇතිවීමට ද ඉඩ ඇත.

නිරීක්ෂණ සහ නිගමන :

පළමු වැනි පාර්ශ්වයේ සහනය පතන ඉංජිනේරු සහකාර වරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය (Recruitment procedure)අවසන් වීමෙන් පසු ව ඔවුන් අදාළ තනතුරට පත්කර ගන්නා බවට ''ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) III පංතිය තනතුරට පත්කිරීම'' සහ ''ඉංජිනේරු සහකාර (සිවිල්) III පංතිය තනතුරට පත්කිරීම'' යන හිසින් යුතු ව අදාළ පරිදි ඔවුන්ට පත්වීම් ලිපියක් (පළමුවැනි පත්වීමේ ලිපිය) ලබා දී ඇත. එම පත්වීමේ ලිපියේ පළමුවැනි පත්වීම් ලිපිවල 03 වැනි ජේදයේ අඩංගු කොන්දේසිය ඉතා නිශ්චිත එකකි. එම කොටස එකී පත්වීමේ ලිපියට ඇතුලත් කිරීම පිළිබඳ තත්ත්වය මෙහි දී සැලකිල්ලට ගතයුතු කරුණකි. එම කොන්දේසිය ආයතනයේ සේවකයින් බඳවා ගැනීමේ කටයුත්ත රාජකාරිමය වශයෙන් ඉටුකළ බඳවා ගැනීමේ විෂය භාර නිලධාරියා අතින් සිදු වූ ප්‍රමාද දෝෂයක් හෝ අත්වැරැද්දක් ලෙස සිතීම අසීරු කරුණකි. එම පළමුවැනි පත්වීමේ ලිපිය සකස් කිරීමේ දී අවස්ථානුකූල ව යම් යම් කොන්දේසි සමහරක් ඊට ඇතුළත්කොට ඇති අතර, මෙම කාර්මික ආරාවුලට පදනම වූ එකී 03 වැනි කොන්දේසිය අහඹු වශයෙන් ඇතුළත් වූවක් ලෙස සැලකීම ද අපහසු කරුණකි. එය එවකට බලාන්විත ව පැවති බඳවා ගැනීමේ පටිපාටියට ඇතුලත් කොන්දේසි පදනම් කරගෙන අඩංගු කළා ය යන්න පැහැදිළිය. මෙම බේරුම්කරණ විභාගයේ දී දෙවැනි පාර්ශවයේ ආයතනය වෙනුවෙන් සාක්ෂි දුන් සාක්ෂිකරු ද වූ, ආයතනයේ අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ) ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා සේවායෝජක ආයතනයේ පළමුවැනි ප්‍රකාශයේ දී මේ කාරණය පිළිබඳ ව ඉතා පැහැදිලි විස්තරයක් කොට ඇත. එකී පළමු ප්‍රකාශයේ ඇමුණුම් 1 ලෙස අමුණා ඇති ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියේ ඉංජිනේරු සහකාර III වැනි පන්තියට අදාළ පිටුවල උධෘතය ඉතා ප්‍රයෝජනවත් තොරතුරක් සපයයි. එහි පසුපස පිටුවේ තවත් කරුණු අතර මෙසේ සඳහන් වේ.

" NOTE: Engineering Assistants with out side experience will be recruited as Engineering Assistant- Cl III and they will be given the benefit of the salary of Engineering Assistant - Cl II (Board Grade 9) if they posses more than two years of experience after obtaining their NDT qualifications. On completion of 2 years experience in the Board Service, they will be considered for promotion to Engineering Assistant - Cl II Level.....

External candidates may be recruited to this grade as an Engineering Assistant- Cl III with additional incremental credits according to their experience."

මෙම සේවක පිරිස සේවයට බඳවා ගන්නා අවස්ථාව වන විට බලාත්විත ව පැවැත ඇත්තේ 1991 වර්ෂයේ දී සකස් කොට ඒ වන විටත් වලංගු ව ක්‍රියාත්මක වූ ආයතනයේ කලක් පැවති බඳවාගැනීමේ පටිපාටියයි. ඉහත දක්වූ උධෘතයේ අඩංගු කොන්දේසිය මෙහි සහනය පතන ඉල්ලුම්කරුවන් පස් දෙනාට නිසැක ව ම අදාළ වේ. රාජ්‍ය සංස්ථාවක සේවකයෙකු පත්කළ යුත්තේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියකට අනුකූල ව ය. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ අඩංගු බඳවා ගැනීමේ සුදුසුකම් සහ වෙනත් සේවා තත්ත්වයන් හා කොන්දේසිවලින් සේවකයින් මෙන්ම සේවායෝජකයා ද බැඳේ. 2006 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති අංකඃ 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය නිසි අයුරෙන් ක්‍රියාත්මක කිරීමේ බැඳීමෙන් මිදී යාමට මෙම සේවායෝජක ආයතනයට ඉඩක් නොමැත. 2006 දී නිකුත් කෙරුණු එකී කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක වී ආයතනයේ ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් කොට කඩිනමින් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කොට හෝ අලුතෙන් සකස් කොට හෝ තිබුණේ නම් 2012 වර්ෂයේ දී සිදු කරන ලද මෙම බඳවා ගැනීම එකී නව බඳවා ගැනීමේ පටිපාටි යටතේ කළ හැකිව තිබුණි. දෙවැනි පාර්ශවය විසින් R1 ලෙස ලකුණු කොට ඉදිරිපත් කළ ''කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන අනුව කාර්ය මණ්ඩලය අනුමත කිරීම - ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය'' යන හිසින් යුතු ව 2011.06.01 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවායෝජක ආයතනය වෙත එවනු ලැබ ඇති ලිපියේ 03 වැනි ඡේදයේ මෙසේ සඳහන් වේ.

''03. අනුමත කාර්ය මණ්ඩලය තුළ 2011.05.31 වැනි දින දක්වා පවතින තනතුරු පුරප්පාඩු පමණක් පිරවීම සඳහා ද මෙයින් අනුමැතිය දෙමි. මේ සඳහා භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන ලබා නොදෙන අතර, එම බඳවා ගැනීම් විධිමත්ව, විනිවිධභාවයෙන් යුක්තව සිදුකළ යුතුය. ඊට ප්‍රථම නව බඳවා ගැනීමේ පටිපාටි මෙම දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරවාගත යුතුය. ප්‍රතිව්‍යුහගතකරණය යටතේ අනුමත සියලුම තනතුරු සඳහා ....වෙබ් අඩවියේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යටතේ දක්වා ඇති ආදර්ශය අනුව යෝජිත බඳවා ගැනීමේ පටිපාටි සකස් කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත නිර්දේශ සඳහා යොමු කළ යුතු වේ.''

මෙයින් පැහැදිලි වන්නේ 2011.06.01 වැනි දින වන විටත් කළමනාකරණ චක්‍රලේඛ අංකඃ 30 ප්‍රකාර ව සිදුවිය යුතු ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අනුගත ව නව බඳවා ගැනීමේ පටිපාටිය සේවායෝජක ආයතනය විසින් සකස් කර නොතිබුණු බවයි. ඉන් පසුව හෝ ආයතනයේ නව බඳවා ගැනීමේ පටිපාටි සකස් කර ඇති බවට කිසිදු සඳහනක් සාක්ෂි මෙහෙයුම්වල දී ඉදිරිපත් වූනේ නැත. තත්ත්වය එසේ නම් මෙම කාර්මික ආරවුලේ විෂයයට අදාළ ඉංජිනේරු සහකාර පත්කිරීම් ක්‍රියාවලියට ද, 2012.04.16 වැනි දින හෝ ආසන්න කාලයේ දී නිකුත් කර ඇති පත්වීමේ ලිපි නිකුත් කිරීම සඳහා ද පදනම් කර ගෙන ඇත්තේ ඉහතින් ද සඳහන් කළ 1991 වර්ෂයේ දී සකස් කොට ඒ වන විටත් වලංගු ව ක්‍රියාත්මක වූ බඳවා ගැනීමේ පටිපාටියේ ප්‍රතිපාදන ම බව ඉතා පැහැදිළි ය. ඒ අනුව පළමුවැනි පත්වීම් ලිපියේ 03 වැනි සේවා කොන්දේසියට ඉහතින් දක්වූ උධෘතයේ සඳහන් කොටස ඇතුළත් වී ඇත්තේ ඉහතින් උපුටා දක්වූ 1991 වර්ෂයේ සිට පැවති බඳවා ගැනීමේ කොන්දේසියෙන් බැහැර වීමට සේවායෝජක ආයතනයට නොහැකි වී ඇති නිසා බව පෙනී යයි.

දෙවැනි පාර්ශවය ගෙන ඒමට වෑයම් කළ තවත් කරුණක් වන්නේ මෙම ඉල්ලුම්කරුවන්ට 2012.04.16 වැනි දින හෝ ආසන්න දිනයක දී නිකුත් කරන ලද පළමුවැනි පත්වීම් ලිපිය තාවකාලික සහ එතරම් වලංගුභාවයක් නැති ලිපියක් ලෙසටත්, බලාත්මක වන්නේ හුදෙක්ම ඊට පසුව නිකුත් කළ විධිමත් පත්වීම් ලිපිය ලෙසටත් පිළිගැනීමට බේරුම්කරණය යොමු කිරීමටයි. ඒ පළමුවැනි පත්වීමේ ලිපියේ 08 වෙනි ඡේදයේ ''ඔබ පත්වීම භාර ගැනීමෙන් පසු විධිමත් පත්වීමේ ලිපියක් නිකුත් කරනු ලැබේ'' යැයි යනුවෙන් සටහනක් ඇතුළත් වේ. එහෙත් එහි කිසි තැනෙක එකී ලිපිය තාවකාලික ලිපියක් බව හෝ වෙනත් විධිමත් පත්වීමේ ලිපියක් කිරීමෙන් එය අහෝසි වන බවක් හෝ සඳහන් නොවේ. ඒ හැරුණු විට වලංගු විධිමත් පත්වීමේ ලිපිය ලෙස දෙවැනි පාර්ශ්වය තහවුරු කිරීමට වෑයම් කළ දෙවැනි පත්වීමේ ලිපියේ වුව ද කිසි ම තැනෙක කලින් ලබා දුන් පත්වීම් ලිපිය තාවකාලික එකක් ලෙස සලකා එහි කොන්දේසි බලරහිත වන සඳහනක් නැත. ඇත්තෙන් ම එම ලිපි දෙකෙහි ම සඳහන් කරුණු එකිනෙක පරස්පර නොවන තාක් ඇත්තෙන් ම ඒවා සියල්ල සේවා කොන්දේසි බවට පිළිගැනීමට අපට සිදු වේ. මේ සම්බන්ධයෙන් ලිපි දෙක අතර ගැටීමක් නැත. ඇත්තේ එකිනෙකින් වන ඌනපූරණයක් පමණි. එසේ නිකුත් කරන ලද දෙවැනි පත්වීමේ ලිපිය මගින් පළමුවැනි පත්වීමේ ලිපියේ සඳහන් මෙහි දී විෂයගත කොන්දේසිය ඉවත් කිරීමේ සැබෑ අවශ්‍යතාවක් තිබුණේ නම්, එය දෙවැනි පත්වීමේ ලිපිය මගින් පහසුවෙන් සිදු කිරීමේ හැකියාව පාලනාධිකාරියට තිබුණි.

තව ද, මෙහි ලා පළමුවැනි පත්වීම් ලිපි සහ විධිමත් පත්වීම් ලිපි යැයි හඳුන්වන දෙවැනි පත්වීම් ලිපි නිකුත් කිරීමට ගත වී ඇති කාලය පරතරයත් ද සැලකිල්ලට ගත යුතු ව ඇත. වැල්අරඹ මහතාට පළමුවැනි පත්වීමේ ලිපිය 2012.04.16 වැනි දින නිකුත් කර ඇති අතර, දෙවැනි පත්වීමේ ලිපිය නිකුත් කර ඇත්තේ 2013.07.31 වැනි දින දී ය. ජයරත්න මහතාට පළමුවැනි පත්වීමේ ලිපිය 2012.05.19 වැනි දින දීත්, දෙවැනි පත්වීමේ ලිපිය 2012.11.23 වැනි දින නිකුත් කර ඇත. පළමුවැනි පත්වීමේ ලිපියේ සඳහන් කොන්දේසි එතරම් පහසුවෙන් ඉවතලිය හැකි නම් මේ කාලපරතරය තුළ දී ඒවායේ බලපැවැත්ම කෙබඳු වී ද යන්න ප්‍රශ්නයකි. රැකියාලාභියෙකුගේ සේවාවට ඉඳුරා ම බලපාන කොන්දේසි සහ නියමයන් සමහරක් ඇතුළත් කොට නිකුත් කරන විධිමත් පත් වීමේ ලිපියක් 'සේවා ගිවිසුමක්' ලෙස පිළිනොගැනීමට බේරුම්කරණයට හේතුවක් නැත. මෙම පළමුවැනි පත්වීමේ ලිපිය ආයතනයේ සාමාන්‍යාධිකාරී වෙනුවට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස් සහ පාලන) සේවායෝජක වශයෙන් ද, ''ඉහත කොන්දේසි පිළිගෙන ....තනතුරෙහි රාජකාරී වාර්තා කරමි/ නොකරමි'' යනුවෙන් රැකියාලාභියා ද අත්සන් කිරීමෙන් සේවා ගිවිසුමක තිබිය යුතු මූලික නෛතික අවශ්‍යතා එහි සම්පූර්ණ වී ඇති බව ද බේරුම්කරණය විශ්වාස කරයි. ඒ අනුව පෙර සේවා කාලය පදනම් කරගෙන වැටුප් පියවරයන්හි තැබීමට අදාළ ඉහත සඳහන් කොන්දේසිය සේවා ගිවිසුම ලෙස සැලකිය හැකි පත්වීම් ලිපියක සඳහන් සේවා කොන්දේසියක් බවට බේරුම්කරණය නිගමනය කරයි. එකී සේවා කොන්දේසිය සපුරාලීමට සේවායෝජක පාර්ශවයට ඇති වගකීම පැහැරහැරිය නොහැකි ය.

මෙහි පළමුවැනි පාර්ශ්වයේ පස් දෙනා සේවයට බඳවා ගන්නා අවස්ථාවට පෙර කාලයේ ද ඉංජිනේරු සහකාර තනතුරට පුද්ගලයින් බඳවා ගැනීමේ ලා ආයතනය අනුගමනය කරනු ලැබ ඇති බඳවාගැනීමේ පිළිවෙත ම තවදුරටත් ඉදිරියට ගෙන යමින්, එවකට බලාත්මක ව පැවති බඳවාගැනීමේ පටිපාටිය ප්‍රකාර ව බඳවාගන්නන්ගේ පෙර සේවා කාලයට ප්‍රතිලාභ ලබාදීමේ අදහස ඇති ව කටයුතු කර ඇති බව පෙනේ. ඒ අයුරෙන් සේවයට බැඳෙන අවස්ථාවේ දී සේවායෝජක ආයතනය විසින් රැකියාලාභීන්ට පත්වීමේ ලිපිය මගින් දෙනු ලැබූ ඉහත කී සේවා කොන්දේසිය ඉටුකරවා ගැනීමේ සාධාරණ අභිලාෂයක් (Reasonable expectation) මෙහි ඉල්ලුම්කරුවන් පස් දෙනා වෙත තිබීම යුක්තියුක්ත වේ.

එපමණක් නොව මෙම සේවා කොන්දේසිය ක්‍රියාත්මක නොකිරීම ආයතනයේ සේවක වෘත්තීය සමිතිවල ඉල්ලීමක් බවට පරිවර්තනය වී ඇති බව ද පෙනේ. ඒ අනුව ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ වෘත්තීය සමිතියේ හා කාර්මික නිලධාරීන්ගේ සංගමයේ මෙහෙයවීමෙන් 2017 අප්‍රේල් මාසය වන විට ආයතනයේ අකුරට වැඩ කිරීමේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් දියත් කරන ලද බවත්, (එවකට අදාළ වූ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යංශයේ ලේකම්වරයාගේ සහභාගිත්වයෙන්, ආයතනයේ කළමනාකාරීත්වය

සහ වෘත්තිය සමිති අතර පැවති සාකච්ඡාවක දී ''පූර්ව සේවා පළපුරුද්ද සැලකීම'' සම්බන්ධ ඉල්ලීම සම්බන්ධයෙන් එළඹි තීරණයන් පිළිබඳ ව ලේකම්වරයාගේ අත්සනින් වෘත්තීය සමිතිය වෙත එවා ඇති 2017.04.16 දිනැති ලිපියෙන් (A6 ලේඛනය) පැහැදිළි ව පෙනේ. එහි දෙවැනි ඡේදය මෙසේ ය.

''02. ඔබගේ වෘත්තිය ඉල්ලීම හා යෝජනා සඳහා අතිරේක සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) ගේ නිර්දේශිත වාර්තාව සම්බන්ධයෙන් ඇති වූ එකඟතාවයන් හා ඒ එකඟතාව මත වහාම ක්‍රියාත්මක වන පරිදි අකුරට වැඩ කිරීමේ වෘත්තිය ක්‍රියාමාර්ගය අවසන් කිරීමට ඔබ ගත් තීරණය ඉතා අගය කොට සලකමි. ඒ අනුව,

01. බාධක දීමනාව,
02. නිලවාහන භාවිතය,
03. පූර්ව සේවා පළපුරුද්ද සැලකීම.

යන ඉල්ලීම් 03 මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි ලබා දීමටත්,...........ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ''.

තව ද 2015.01.16 දාතමින් ආයතනයේ ජ්‍යෙෂ්ඨ මානව සම්පත් නිලධාරි විසින් ''පූර්ව සේවා කාලය වෙනුවෙන් වැටුප් වර්ධක ප්‍රදානය කිරීම'' යන මැයින් මෙහි සහනය පතන අය අතුරින් එක් අයෙකු වන ජයරත්න මහතාට නිකුත් කර ඇති ලිපියක (A5) මෙසේ සඳහන් වේ.

''02. ඒ අනුව ඔබ මණ්ඩල සේවයට බැඳුණු 2012.06.14 වැනි දින සිට රු. 29,256 - 481×15- 36,471 වැටුප් පරිමානයේ වැටුප් වර්ධක අටක් (08) සහිතව රු. 33,104 වැටුප් පියවරේ තබා ඔබගේ වැටුප් පියවර සකසනු ලැබේ. ....''

එම ලිපියෙන් ඔහු වැටුප් වර්ධක අටක් එකතු කළ රුපියල් 33,104/ ක වැටුප් පියවරේ පිහිටුවීමට සේවායෝජක ආයතනය කටයුතු කොට, ඒ අනුව වැටුප් ගෙවීමට කටයුතු කරන බව පවා දනුම් දී ඇත. එම ලිපිය නිකුත් කර ඇතත් අදාළ කාර්යය ඉටු නොවූ බවට සාක්ෂි මෙහෙයවුණි. රජයට සම්බන්ධ ආයතනයක් මෙසේ කටයුතු කළේ කෙසේ ද යන්න ප්‍රශ්න සහගත ය. තව ද 2018.08.21 වැනි දින බේරුම්කරණ විභාගයේ දෙවැනි පාර්ශ්වයේ නීතිඥවරිය පළමුවෙනි පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් (සහනය පතන්නෙකු ද වන) හරස් ප්‍රශ්න විමසන අවස්ථාවේ සාක්ෂිකරුට යොමුකරන යෝජනාවක් මෙසේ උපුටා දක්වමි (2018.08.21 වැනි දින කාර්ය සටහන් පිටු අංක 26).

> ''ප්‍රඃ සාක්ෂිකරුට මම යෝජනා කරනවා වගඋත්තරකාර ආයතනය විසින් තමුන්ට පූර්ව සේවය සළකලා යම් මුදලක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් අරගෙන තිබුනත් එම තීරණය පසුව පැවැති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථිර කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරලා තියෙනවා කියලා. තමුන් ඒක පිළි ගන්නවා ද?''

මේ සියල්ල මගින් එළඹිය හැකි අනුමිතියක් වන්නේ මෙහි සහනය පතන ඉංජිනේරු සහකාරවරුන්ගේ මෙම කාර්මික ආරවුලට සම්බන්ධ ප්‍රශ්නය වන ''පූර්ව සේවා කාලය වෙනුවෙන් වැටුප් වර්ධක ප්‍රදානය කිරීම'' සාධාරණ එකක් බව සේවායෝජක ආයතනයේ පාලනාධිකාරය නිශ්චිතව පිළිගෙන, එම ඌණතාව නිවැරදි කිරීමට යම් යම් පියවර ද විවිධ අවස්ථාවල දී ගනු ලැබූ බව ය. මේ කරුණුවලින් පෙනී යන්නේ මෙම බේරුම්කරණ යොමුවට අදාළ කාර්මික ආරවුල උපචිත වූ කාරණය ධනාත්මක ව විසඳීම අවශ්‍ය බවට ආයතනයේ දැඩි විශ්වාසයක් තිබුණා පමණක් නොව ඒ සඳහා බලවත් උත්සාහයක් ද දරා ඇති බවයි. එසේ වුවත් එය අවංක ව ක්‍රියාවට නැංවීමට අපොහොසත් වීම නිසා කාර්මික ආරවුලක් බවට පත් වී ඇත.

ස්වකීය මුල් පත්වීමේ ලිපියේ 03 වන ජේදය ප්‍රකාර ව හිමිකම් පතන පෙර සේවා කාලය සැලකීම සඳහා වූ කොන්දේසිය මෙහි සහනය පතන ඉල්ලුම්කරුවන් පස්දෙනාට නොලැබුණත් ඔවුන් සමග එකට සේවයට බැඳුණු ඉංජිනේරු සහකාර එල්. එම්. අයි. යූ. සිල්වා මහතාට ලැබීම නිසා ඔවුන්ට අසාධාරණයක් සිදු වී ඇද්ද යන්න නිර්ණය කිරීම මෙම යොමුවට ඇතුළත් තවත් අංගයකි. පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සාක්ෂිවලින් පළමුවැනි පාර්ශ්වය තහවුරු කිරීමට වෑයම් කළේ, එකී සිල්වා මහතාට අදාල සේවා වාසිය අත්කිරීම ගැන ඉල්ලුම්කරුවන්ගේ කිසිදු විරුද්ධත්වයක් නොමැති බවත්, එය ඔහුට ලබාදීම සාධාරණ බවත්, එය ඔහුට ලැබුණු වෘත්තීය අයිතියක් බවත්, ඒ අනුව ම යමින් තමන්ට ද එකී හිමිකම් ලබාදිය යුතු බවත් ය. සාක්ෂි විභාගය ආරම්භයේ දී පවා ආයතනය වෙනුවෙන් බේරුම්කරණය ඉදිරියේ පෙනී සිටි අය එකී සිල්වා මහතාට පෙර සේවා කාලයට අදාළ වැටුප් ගැළපීම් ඒ අයුරෙන් කොට වැටුප් ගෙවා තිබුණේ ය යන්න දැන නොසිටි බව පෙනී ගියේ ය. වෙනෙකක් තබා දෙවැනි පාර්ශ්වයේ අවසන් ලිඛිත සැලකිරීම්වල දී කියා ඇත්තේ සිල්වා මහතා ඒ අයුරෙන් වැටුප් ලබා ගන්නා බව ආයතනයේ පාලනාධිකාරිය දැන ගත්තේ මෙම බේරුම්කරණ විභාගය ආරම්භ වීමෙන් ද පසුව බව ය. සැබැවින් සිදු ව ඇත්තේ බඳවාගත් ඉංජිනේරු සහකාරවරුන් සියලු දෙනා ම වෙනුවෙන් ඔවුන්ගේ පූර්ව සේවා ආයතන වෙතින් අවශ්‍ය සේවා තොරතුරු රැස් කිරීමට සේවායෝජක ආයතනය පියවර ගනු ලැබූ බවත්, එකී විස්තර කඩිනමින් ලබා ගත හැකි වූ සිල්වා මහතා වැටුප් වර්ධක 08ක් එකතු කළ වැටුප් තලයේ පිහිටුවීම කර ඇති බවත් ය. එසේ නමුත් අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ විස්තර ලැබීමට පෙර ආයතනයේ පිළිවෙත වෙනස් වී ඇති නිසා ඔවුන්ට අවාසියක් සිදු වී ඇත. එසේ වුවත් සාක්ෂි වලින් ඉදිරිපත් කෙරුණේ R15, R16, R17, සහ R18 ලේඛන ලකුණු කොට ඉදිරිපත් කරමින් සිල්වා මහතා අදළ වැටුප් තලවල පිහිටුවා වැටුප් ගෙවා ඇත්තේ ප්‍රමාද දෝෂයකින් බවත්, එම දෝෂය අනාවරණය වීමෙන් පසු ව ඔහුගෙන් එසේ වැඩිපුර ගෙවන ලද වැටුප් මුදල් අය කර ගැනීමට ක්‍රියා කර ඇති බවත් ය. එසේ වුවත් එසේ තමාට ගෙවන ලද වැටුප ආපසු අයකර ගැනීමට එරෙහි ව කරුණු දක්වමින් සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපියක පිටපතක් R14 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරන ලදී. සිල්වා මහතාට එසේ ප්‍රමාද දෝෂයකින් අතිරේකව ගෙවන ලද මුදල් ආපසු අයකර ගනු ලැබුවත්, එම සංසිද්ධිය පිළිබඳව බේරුම්කරණය එළඹෙන අනුමිතිය වන්නේ සිල්වා මහතාට පමණක් නොව ඔහු සමග එකට සේවයට බැඳුණු එක ම වෘත්තීය ශ්‍රේණියේ ඉංජිනේරු සහකාරවරුන්ට පත්වීම් ලිපියේ කොන්දේසියක් ලෙස හිමි වූ අයිතියක් ලෙස ආයතනයේ පාලනාධිකාරිය ලබාදීමට ක්‍රියාමාර්ග ගනිමින් සිට ඔවුන්ට ලබාදීම අහිමි කරනු ලැබූවක් ලෙස ය.

මේ තත්ත්වය මෙසේ වුවත් දෙවැනි පාර්ශ්වයේ ප්‍රධාන ම තර්කයක් වී ඇත්තේ සේවායෝජක ආයතනය රජයට සම්බන්ධ ආයතනයක් බවත්, එහි සේවකයින්ගේ වැටුප් ආදිය සම්බන්ධයෙන් කටයුතු කළ හැක්කේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ තීරණයන්ට යටත් ව බවත්, මෙම බඳවා ගැනීම සිදුකෙරෙන විට 2006 වර්ෂයේ දී නිකුත් වූ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ප්‍රකාර ව කටයුතු කිරීමේ දී මෙම පෙර සේවා කාලය පිළිබඳ කොන්දේසිය ක්‍රියාත්මක කළ නොහැකි බවත්, එසේ කළහොත් එය වැටුප් විෂමතාවන් ඇතිවීමට තුඩුදෙන කාරණයක් බවත් ය. එම කරුණු බේරුම්කරණය දැඩි අවධානයට ලක් කරනු ලැබුවත් ආයතනයේ පරිපාලන ඌනතා නිසා ඇති වූ කරුණු මගින් සේවක අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් තහවුරු කරදීමට බේරුම්කරණයට හැකියාවක් නොමැත.

ආරම්භයේ දී දෙපාර්ශ්වය ලබා දුන් ප්‍රකාශයන් ද, මෙම බේරුම්කරණ විභාගයේ දී මෙහෙයවන ලද සාක්ෂි ද, දෙපාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් ඉදිරිපත් කළ අවසන් ලිඛිත සැලකිරීම් ද සැළකිල්ලට ගෙන, මෙහි සහනය පතන ඉල්ලුම්කරුවන් පස් දෙනාට ඔවුන් වෙත නිකුත් කරනු ලැබූ මුල් පත්වීමේ ලිපියේ 03 වන ජේදය ප්‍රකාර ව පෙර සේවා කාලය සැලකීම සඳහා වූ කොන්දේසිය සේවායෝජක ආයතනය විසින් සපුරා නැති බවත්, ඒ නිසා ඔවුන්ට අසාධාරණයක් සිදු වී ඇති බවත් නිගමනය කරමි. ඒ අනුව A5 ලේඛනයේ දත්ත අනුසාරයෙන් පළමුවැනි පාර්ශ්වයේ සහනය පතන ඩබ්ලිව්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මහතා, යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මහතා, ජේ. ඒ. එන්. බී. ජයසූරිය මහතා, ජේ. එම්. ටී. එන්. බී. ජයසූරිය මහතා, සහ කේ. එම්. ටී. තරංගනී මහත්මිය යන අයට ඔවුන් සේවයට වාර්තා කළ දිනයන් පදනම් කරගෙන ඉංජිනේරු සහකාර තනතුරේ රු. 29,256/= - 481 x 15 - රු. 36,471/= වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක 8ක් එකතු කොට ආරම්භක වැටුප තීරණය කොට ගෙවීමෙන් ඔවුනට සිදු වී ඇති අසාධාරණය වෙනුවෙන් සහනය සැලසිය යුතු බවට නිගමනය කරමි.

ප්‍රදානය

1. පළමුවැනි පාර්ශ්වයේ සහනය පතන පහත සඳහන් ඉංජිනේරු සහකාරවරුන් පස්දෙනා MA 2-2 වැටුප් කාණ්ඩයේ ix මාණ්ඩලික ශ්‍රේණිය යටතේ වන රු.29,256/= - 481 x 15 - රු. 36,471/= වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක 8ක් එකතු කොට පහත සඳහන් පරිදි ඔවුන් එක් එක් අයට පෞද්ගලික වන සේ, ඔවුන්ගේ පත්වීම් දිනයන්හි සිට බලපැවැත්වෙන සේ ආරම්භක වැටුපේ පිහිටවිය යුතු ය.

(අ) ඩබ්ලිව්. වී. ඩී. එම්. පී. වැල්අරඹ මහතා

පත්වීමේ දිනය	*වැටුප් වර්ධක දිනය*	*පිහිටවිය යුතු ආරම්භක වැටුප*
2012.05.02	මැයි මස 02	රු. 33,104/=

(ආ) යූ. ඒ. නිහාල් ලක්ෂ්මන් ජයරත්න මහතා

පත්වීමේ දිනය	වැටුප් වර්ධක දිනය	පිහිටවිය යුතු ආරම්භක වැටුප
2012.06.14	ජුනි මස 14	රු. 33,104/=

(ඇ) ජේ. ඒ. එන්. බී. ජයසූරිය මහතා

පත්වීමේ දිනය	වැටුප් වර්ධක දිනය	පිහිටවිය යුතු ආරම්භක වැටුප
2012.06.22	ජුනි මස 22	රු. 33,104/=

(ඈ) ජේ. එම්. ටී. එන්. බී. ජයසූරිය මහතා

පත්වීමේ දිනය	වැටුප් වර්ධක දිනය	පිහිටවිය යුතු ආරම්භක වැටුප
2012.05.23	මැයි මස 23	රු. 33,104/=

(ඉ) කේ. එම්. ටී. තරංගනී මහත්මිය

පත්වීමේ දිනය	වැටුප් වර්ධක දිනය	පිහිටවිය යුතු ආරම්භක වැටුප
2012.05.11	මැයි මස 11	රු. 33,104/=

2. ඉහත අංක 1 ප්‍රදානයේ දක්වා ඇති ආරම්භක වැටුප් පියවරේ පිහිටවීමෙන් පසු ව මේ දක්වා කාලයට ඔවුන් එකිනෙකාට පෞද්ගලික වන සේ නියමිත වාර්ෂික වැටුප් වර්ධක ප්‍රදානය කොට සියලු හිඟ වැටුප් ගණනය කොට ගෙවිය යුතු ය.

3. ඔවුන් පත්වීම් ලැබූ දින සිට මේ දක්වා හිමිකම් ලබන උසස්වීම්වලට අදාළ ව සහ සේවායෝජක ආයතනය විසින් පොදුවේ සේවකයින්ගේ වැටුප් ක්‍රමයන්හි කරනු ලැබූ වෙනත් සාධනීය වෙනස්කම් ඇතොත් ඒවාට අදාළ ප්‍රතිලාභ ද ගලපා එකිනෙකාට පෞද්ගලික වන සේ ගෙවිය යුතු ය.

4. ඉහත අංක 1 හා 2 ප්‍රදානයන් අනුව ගණනය කළ හිඟ වැටුප්වලට අදාළ සේවක අර්ථසාධක අරමුදලේ සේවක දායකත්ව ප්‍රතිශතයන් ගණනය කොට එකී හිඟ වැටුප් මුදලින් අඩු කර ගත යුතු ය.

5. ඉහත අංක 1 හා 2 ප්‍රදානයන් අනුව ගණනය කළ හිඟ වැටුප්වලට අදාළ සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාර අරමුදල් දායකත්ව මුදල් සේවායෝජක ආයතනය විසින් නිසි පරිදි තැන්පත් කළ යුතු ය.

6. ඉහත ප්‍රදානයන්හි සඳහන් සියලු ම සහනයන් මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වී මාස තුනක් ඇතුළත සේවායෝජක ආයතනය විසින් සළසා ගෙවා නිම කළ යුතු ය. ප්‍රදානයේ සියලු අංග සම්පූර්ණ කළ බවට සහකාර කම්කරු කොමසාරිස් (දකුණු කොළඹ) නොපමාව වාර්තා කළ යුතු ය.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2022 පෙබරවාරි මස 20 වැනි දින.
කාර්මික අධිකරණයේ දී ය.

EOG 04 - 0199/1

මගේ අංකය - IR/15/29/2012.

කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.01.04 දිනැති හා අංක 2000/47 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.12.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කඩුවෙල, වැලිවිට, විහාර මාවත, දෙවන පටුමග, අංක, 448/22 හි පදිංචි ජී. සී. එම්. ඒ. ජයවර්ධන මිය සහ කොළඹ 07, නිදහස් චතුරස්‍රය, ශ්‍රී ලංකා පදනම් මාවත, අංක 100 හි පිහිටි ශ්‍රී ලංකා පදනම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.02.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් 08 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.

යොමු අංකය : IR/15/29/2012

කාර්මික අධිකරණයේ දී ය.

ජී.සී.එම්.ඒ. ජයවර්ධන මිය,
අංක : 448/22, දෙවන පටුමග,
විහාර මාවත,
වැලිවිට, කඩුවෙල.

පළමු පාර්ශවය

නඩු අංකය : A 01/2017

සහ

ශ්‍රී ලංකා පදනම,
අංක 100, ශ්‍රී ලංකා පදනම මාවත,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

දෙවන පාර්ශවය

අතර පවතින කාර්මික ආරවුල

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවෙන) පනත්වලින් සංශෝධනය වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2016.12.29 දිනැති නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

බේරුම්කරණ විභාගයේ පසුබිම, පෙනී සිටීම සහ එය පැවැත්වූ ආකාරය

2016.12.29 දිනැති එකී නියෝගය මගින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් බේරුම්කරණයෙන් විසඳීමට අංක IR/15/29/2012 දරන යොමුව යටතේ මා වෙත යොමු කර ඇති කාර්මික ආරවුලට සම්බන්ධ කාරණය වන්නේ :

''ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අධ්‍යක්ෂකගේ රහස්‍ය ලේකම් ලෙස සේවය කළ ජී. සී. ඇම්. ඒ. ජයවර්ධන මහත්මියට කළමනාකරණ චක්‍රලේඛ අංක 30 සහ 30(1) අනුව නිසි පරිදි වැටුප් පරිවර්තනය නොකිරීමෙන් අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එලෙස අසාධාරණයක් සිදු වී ඇත්තම් ඇයට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

පළමු පාර්ශවයත් දෙවැනි පාර්ශවයත් තමන්ගේ මූලික ස්ථාවරය පැහැදිලි කරමින් විධිමත් ලෙස පළමුවැනි ප්‍රකාශ ඉදිරිපත් කර තිබිණි. බේරුම්කරණ විභාග පටිපාටිය අනුව දෙවැනි ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී කළ යුතු වන්නේ ප්‍රතිපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද පළමුවැනි ප්‍රකාශයේ දක්වා ඇති කරුණු වලට ප්‍රතිඋත්තර සැපයීමයි.දෙවැනි පාර්ශවයෙන් ඉදිරිපත් කෙරුණු පළමුවැනි

ප්‍රකාශයේ දක්වා තිබුණ එක් එක් සම්ප්‍රකාශයන්ට අදාල ව පළමු පාර්ශවය එපරිද්දෙන් පිළිතුරු සපයා ඇතත්, දෙවැනි පාර්ශවය කර තිබුනේ තමන් විසින් ඉදිරිපත් කර තිබුණ පළමුවැනි ප්‍රකාශය ඒ අයුරෙන් ම දෙවැනි ප්‍රකාශය වශයෙන් නැවතත් ඉදිරිපත් කිරීමකි. එකී ලේඛන පදනම් කරගෙන බේරුම්කරණ විභාගය පැවැත්වීම ආරම්භ කරන ලද අතර එසේ පළමුවැනි ප්‍රකාශය ම දෙවැනි ප්‍රකාශය වශයෙන් ඉදිරිපත් කිරීමට හේතුව ලෙස දෙවැනි පාර්ශවයෙන් ඉදිරිපත් කළ අවසන් ලිඛිත සැලකිරීම්වලදී කියා ඇත්තේ මුල් අවස්ථාවේ දී දෙවැනි පාර්ශවය නීතිඥ සහයක් නොමැති ව කටයුතු කර තිබීම බවයි. කෙසේ වුවත් දෙවැනි පාර්ශ්වයේ දෙවැනි ප්‍රකාශයේ පැවති ඌණතාව නිසා පරීක්ෂණයේ දී කිසිදු පාර්ශවයකට අගතියක් සිදු නොවීමට වගබලා ගන්නට යෙදුණි.

බේරුම්කරණ විභාගය ආරම්භයේ දී ම සාක්ෂි විභාගය බාහිර කරුණුවලට ඇදී යාම වළක්වා යොමුවේ ඇති කාරණයට ඉලක්කගත ව කරගෙන යාම පිණිස දෙපාර්ශවයේ ම එකඟත්වය පිට පිළිගැනීම් සහ විසඳිය යුතු කරුණු කිහිපයක් තීරණය කොට සටහන් කරන ලදී. එම පිළිගැනීම් සහ විසදනාවන් තීරණය කරනු ලැබුවේ දිසා අධිකරණයක සිදු කරන ආකාරයේ නිශ්චිත නෛතික ක්‍රමවේදයන් අනුගමනය කරමින් නොවන අතර, ඒවා හුදෙක් ම බේරුම්කරණ විභාගය පහසු කරවීමටත් නිවැරදි ව මගපෙන්වීමට පමණක් යොදා ගන්නා බවට පාර්ශ්වකරුවන් දැනුවත් කරන ලද අතර, දෙපාර්ශ්වය විසින් ම එය පිළිගන්නා ලදී. දෙපාර්ශ්වය එකඟ වූ පිළිගැනීම් 3 ක් විය. බේරුම්කරණ විභාගය පැවැත්වුණේ එකී විසඳනාවන් ඉලක්ක කරගෙන ය.

2017.08.16, 2017.09.27, 2017.10.19, 2018.02.16, 2018.06.28, 2018.08.07, 2018.09.18, 2018.10.23, 2019.01.11, 2019.02.15, 2019.04.08 සහ 2019.04.30 යන දිනයන්හි දී මා විසින් මෙම බේරුම්කරණ විභාගය පවත්වා අවසන් කර ඇත. 2019.06.07 දින තෙක් අවසන් ලිඛිත සැළකිරීම් ගොනු කිරීමට කල් දෙන ලදී. පරීක්ෂණය සඳහා දින නියම කරනු ලැබූ දිනයන් කීපයක දී විවිධ හේතූන් නිසා බේරුම්කරණ විභාගය පැවැත්වීමට නොහැකි වූ බව ද සටහන් කරමි.

සහනය පතන ජී. සී. ඇම්. ඒ. ජයවර්ධන මහත්මිය බේරුම්කරණ විභාගය පැවැත්වුණු සෑම දිනක ම සහභාගී වූ අතර, ඇය වෙනුවෙන් නීතිඥ එස්. එච්. ඒ. මොහොමඩ් මහතා බේරුම්කරණ විභාගය පැවති සෑම දිනක ම පෙනී සිටියේ ය. දෙවැනි පාර්ශ්වයේ ආයතනයේ ව්‍යාපාර සංවර්ධන නිලධාරී ටී. එච්. ඒ. ලක්මාල් මහතා, පරිපාලන නිලධාරී චින්තක අරුණ ශාන්ත කාරියකරවන මහතා සහ පරිපාලන සහායක ශෂිකා දූෂාන්ති මහත්මිය යම් යම් දිනයන්හි සහභාගි වූ අතර, නීතිඥ පෙනී සිටීමක් සිදු නොවූ 2017.08.16 සහ 2017.09.27 යන දින දෙක හැරුණු විට බේරුම්කරණ විභාගය පුරාවට ම ආයතනය වෙනුවෙන් නීතිඥ දහම් බින්දුහේවා මහතා පෙනී සිටියේ ය. එක් දිනක් නීතිඥ ජයරාම් භාරතී මහතා ද දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් පෙනී සිටියේ ය.

මෙම බේරුම්කරණ විභාගයේ දී හබයකින් තොර ව පළමුවැනි පාර්ශ්වය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර එම පාර්ශ්වය වෙනුවෙන් සහනය පතන ජී. සී. ඇම්. ඒ. ජයවර්ධන මහත්මියගේ වාචික ව ඉදිරිපත් වූ සාක්ෂිය පමණක් මෙහෙයවන ලදී. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා පදනමේ පරිපාලන සහකාර පිලාන විතානගේ ශෂිකා දූෂානි සංකල්පනා මහත්මිය, මුගුම්තැන්න කාරියකරවන චින්තක අරුණ ශාන්ත මහතා යන අයවලුන්ගේ වාචික සාක්ෂි මෙහෙයවන ලදී.

මෙම පරීක්ෂණයේ දී පළමුවැනි පාර්ශ්වය විසින් A1 සිට A 19 දක්වා ද, දෙවැනි පාර්ශ්වය විසින් R1 සිට R8 දක්වා ද ලේඛන, අතුරු ලේඛන ද සමග ලකුණු කොට ඉදිරිපත් කරන ලදී. එක් පාර්ශ්වයක් විසින් ස්වකීය පාර්ශ්වය වෙනුවෙන් කළ සාක්ෂි විභාග යන්හි දී ලකුණු කළ ඇතැම් ලේඛන අනෙක් පාර්ශ්වය විසින් ස්වකීය පාර්ශ්වයේ ලේඛන ලෙස ලකුණු කළ අවස්ථා රාශියක් ද විය.

පසුබිම

මෙම බේරුම්කරණ යොමුවට අදල කාර්මික ආරවුල සම්බන්ධයෙන් සහනය පතන ජී. සී. එම්. ඒ. ජයවර්ධන මහත්මිය 1976.02.05 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයට (වර්තමානයේ ශ්‍රී ලංකා පදනම) තාවකාලික ඉංග්‍රීසි ලඝුලේඛිකාවක ලෙස බඳවා

ගන්නා ලද අතර, 1976.08.05 දින සිට එහි ඉංග්‍රීසි ලේකම්වරියක ලෙස ස්ථිර සේවයට පත්කරනු ලැබ ඇත. (A1 ලෙස ලකුණු කරන ලද පත්වීමේ ලිපිය) ඇයගේ සේවා ඉතිහාසය මෙසේ ඉදිරිපත් කරන ලදී.

01. 1976.08.05 දින සිට 1981.02.28 දක්වා ඉංග්‍රීසි ලේකම්වරිය
02. 1981.03.01 සිට 1992.11.30 දක්වා සම්බන්ධීකරණ ලේකම් (අධ්‍යාපන අංශය)
03. 1992.12.01 සිට 2001.11.30 සිට ලේකම් (අධ්‍යාපන වැඩසටහන්)
04. 2001.12.01 දින සිට 2012.06.19 දක්වා අධ්‍යක්ෂවරයාගේ රහස්‍ය ලේකම්
    2012.06.19 වන දින ඇය විශ්‍රාම ලබා ඇත.

දෙවැනි පාර්ශවය සේවායෝජක ආයතනය වන ශ්‍රී ලංකා පදනම (Sri Lanka Foundation) පෙර (ශ්‍රී ලංකා පදනම් ආයතනය ලෙස හඳුන්වනු ලැබූ) 1973 අංක 31 දරන පනතින් සංස්ථාපනය කරනු ලැබූ රජයට අනුබද්ධ ආයතනයකි. එහි සේවකයින් ''රාජ්‍ය නිලධාරියා'' යන ගණයට අයත් නොවන අතර ඔවුන්ගේ වැටුප් සහ සේවක සංඛ්‍යා නිර්ණය ආදි කටයුතු වලට සම්බන්ධ බලධරයන් වන්නේ මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික වැටුප් සහ සේවක කොමිෂන් සභාවයි. මෙම සේවායෝජක ආයතනය රාජ්‍ය සංස්ථා අංශයට අදළ ව කලින් කලට නිකුත් කරනු ලබන රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛ එහි සේවකයින්ගේ වැටුප් ප්‍රතිශෝධනයන් සිදුකිරීම සඳහා උපයෝගි කරගෙන ඇත. මෙම කාර්මික ආරවුල උපචිත වන කාරණයට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 සහ 30(1) යටතේ තමා පිහිටවිය යුතු වැටුප් පියවරෙහි නොතැබීමෙන් සහනය පතන ජයවර්ධන මහත්මියට අසාධාරණයක් සිදු වී යයි කරන ඉල්ලීම මත ය.

පළමුවැනි පාර්ශවයේ ස්ථාවරය

- එකී කළමනාකරණ චක්‍රලේඛ අංක 30 සහ 30(1) යටතේ තමන් තැබිය යුතු වැටුප් පියවරෙහි නොපිහිටවීමෙන් මෙහි සහනය පතන ජයවර්ධන මහත්මියට අසාධාරණයක් සිදු වී ඇත්තේය යන්න මෙම බේරුම්කරණ යොමුවට අදාළ ව උපචිත වී ඇති කාර්මික ආරවුල වශයෙන් පළමුවැනි පාර්ශ්වය පෙන්වා දීමට උත්සාහ ගෙන ඇත.

- 2006 වර්ෂයේ දී රජයට අනුබද්ධ සංස්ථා සහ ආයතන ආදියේ නියුතු සේවකයින්ට එකී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් ජාතික මට්ටමින් සිදුකරන ලද වැටුප් ප්‍රතිශෝධනයන්හි දී ශ්‍රී ලංකා පදනමේ සේවකයින්ට අදාළ වැටුප් පරිවර්තනය කරමින් එවන ලද (මෙම විභාගයේ දී A5 a, b, c, d, e ලෙස ලකුණු කළ) ලේඛනයට ඉල්ලුම්කාරිය ජයවර්ධන මහත්මිය දරමින් සිටි අධ්‍යක්ෂකවරයාගේ රහස්‍ය ලේකම් යන තනතුර ඇතුළත් වී නැති බව පළමුවැනි පාර්ශ්වයේ මූලික ස්ථාවරයක් විය. ඊට පෙරාතු ව බලාත්මක වූ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25 ට ප්‍රකාර ව පැවති වැටුප් ක්‍රමය යටතේ ඇය දරමින් සිටි තනතුර ආරම්භක වැටුප රු. 16,625/= වූ 8 වන ගණයට ඇතුලත් (Grade 8) රැකියාවකි. ඒ අවස්ථාවේ දී එකී 8 වන ගණයට අයත් අනිකුත් තනතුරු වූයේ ආයතනයේ පරිපාලන නිලධාරි, සැපයුම් නිලධාරි, සහකාර ගණකාධිකාරි සහ iii වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය යන තනතුරු ය.

- 2006 වර්ෂයේ දී කළමනාකරණ චක්‍රලේඛ අංක:30 යටතේ නව වැටුප් ප්‍රතිසංශෝධන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරද්දී කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් තනතුරු නාමාවලි සහ වැටුප් වගු සකස් කර එවන අවස්ථාවේ දී තමා දරූ තනතුර එහි 8 වැනි ගණයට ඇතුලත් ව නව ශ්‍රේණිගත කිරීම අනුව JM 1-2 කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයට වර්ග කොට රු.24,595/= ක් වන ආරම්භක වැටුපෙහි පිහිටවනු ලැබිය යුතු බව.

එහෙත් එකී අංක 30 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ඇමුණුම් වගුවල ඉල්ලුම්කාරිය දරූ '' අධ්‍යක්ෂකවරයාගේ රහස්‍ය ලේකම් '' (Director's Confidential Secretary) යන තනතුරු නාමය ඇතුලත් ව නොතිබීමෙන් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදු වූ බව.

- ඒ හේතුව නිසා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ වැටුප් තලයන් තීරණය කරන අවස්ථාවේ දී සේවායෝජක ආයතනය, 8 වැනි ගණයේ සිටි තමා ශ්‍රේණියක් පහතට ඇද දමා 9 වන ගණයට ඇතුළත් කොට, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25 යටතේ රු. 13,425/= ක් වූ වැටුප් තලයේ සිටින්නකු තබන රු. 20,495/= වැටුප් තලයේ පිහිටුවා ඇති බව.

- එමගින් 2007 වර්ෂයේ දී ආරම්භක වැටුපේ සිදු වූ අවාසිය එතැන් සිට විශ්‍රාම යන තෙක් ඉල්ලුම්කාරියට බලපෑ බව සහ ඉන් ඇයට විශාල මූල්‍ය අවාසියක් සිදු බව. ඒ අතරතුර තමා සමඟ කළමනාකරණ චක්‍රලේඛ අංක 25 යටතේ රු. 16,625/= ක ආරම්භක වැටුපක හිමිකම් ලබමින් සිටි 8 වන ශ්‍රේණියට ඇතුලත් කර තිබුණු සෙසු තනතුරු වන පරිපාලන නිලධාරි, සැපයුම් නිලධාරි, සහකාර ගණකාධිකාරි සහ 3 වන ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු දරූ අය රු. 24,595/= ක ආරම්භක වැටුපේ තැබීමෙන් තමාට අසාධාරණයක් සිදු වූ බව.

- ඉල්ලුම්කාරිය දරූ තනතුර 'සභාපතිවරයාගේ ලේකම්' නොව 'අධ්‍යක්ෂවරයාගේ ලේකම්' බව.

- ඒ නිසා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 සහ 30 (1) අනුව ඉල්ලුම්කාරීය දරූ අධ්‍යක්ෂවරයාගේ ලේකම් තනතුරට හිමිවිය යුතු ආරම්භක වැටුප පරිවර්තනය නිවැරදි ව සිදු කිරීමෙන් 2007 ජනවාරි මස සිට තමා විශ්‍රාම ගිය දවස දක්වා අහිමිවූ හිඟ වැටුප් ද ඊට අදළ සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් දයකත්ව ප්‍රමාණයන් සහ පාරිතෝෂික දීමනා ගණනය කොට ලබාදිය යුතු බව.

දෙවැනි පාර්ශවයේ ස්ථාවරය

ඉහතින් සඳහන් කළ කලින් ක්‍රියාත්මක වූ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25 යටතේ පළමු පාර්ශවයේ ඉල්ලුම්කාරියටත් තවත් සේවකයින් 16 දෙනෙකුටත් අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් සාපේක්ෂ ව වැඩි වැටුපක් ගෙවා තිබූ බව ඒ අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මකවීමට පෙරාතු කාලයේ ඇයට හිමි ව නොතිබුණ වැඩිපුර වැටුපක අනිසි වාසියක් ඉල්ලුම්කාරිය භුක්ති විඳිමින් සිටි බව.

- කළමනාකරණසේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී එම දෝෂයන් නිවැරදිකොට ඇය සිටිය යුතු රු. 20,490/ ක්වූ ආරම්භක වැටුප් තලය පදනම් කරගෙන වැටුප් පරිවර්තනය සිදුකළ බව.

- දෙවැනි පාර්ශවයේ සේවායෝජක ආයතනය කටයුතු කර ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ ජාතික වැටුප් සහ සේවා කොමිෂන් සභාවේ තීරණ ප්‍රකාරව බව.

- පළමු පාර්ශවයේ ඉල්ලුම්කාරියට සේවායෝජක ආයතනය විසින් අගතියක් කිරීමේ කිසිදු චේතනාවක් නොතිබුණ බව සහ ඇයට සහනයක් ලබාදීමට වරෙක ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ලබා දී එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවටත් ජාතික වැටුප් සහ සේවා කොමිෂන් සභාවටත් උපදෙස් පතා යොමු කරන ලද බව.

- එහෙත් එම ආයතනවලින් ඇයට සහනයන් සැළසීමේ තීරණයක් ලබා නොදුන් බව.

වෙනකක් තබා R5 ලෙස ලකුණු කොට ඉදිරිපත් කළ ජාතික වැටුප් සහ සේවක කොමිෂන් සභාවේ ලිපියකින් සේවායෝජක ආයතනයට දන්වා ඇත්තේ ඉල්ලුම්කාරියට ඒ වන විටත් වැඩිපුර ගෙවා ඇති වැටුප් ඇයගෙන් අයකරගත යුතු බවයි.

- 8 වන ශ්‍රේණියේ තනතුරක් දැරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් ඇය විසින් සම්පූර්ණ කර නොතිබුණු බව සහ එම නිසා ඉල්ලුම්කාරියගේ ඉල්ලීම අසාධාරණ එකක් බව.

නිරීක්ෂණ සහ නිගමන

මෙම කාර්මික ආරවුලට අදාළ ව සහනය පතන ජයවර්ධන මහත්මිය 1976 වර්ෂයේ දී ලඝුලේඛිකාවක ලෙස ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සේවය අරම්භ කොට 2012 වර්ෂය වන තෙක් දීර්ඝ කාලයක් ලේකම් (ඉංග්‍රීසි), සම්බන්ධීකරණ ලේකම් (අධ්‍යාපන අංශය), ලේකම් (අධ්‍යාපන වැඩසටහන්) සහ අධ්‍යක්ෂවරයාගේ ලේකම් ආදි වගකිව යුතු තනතුරු දරමින් සිට විශ්‍රාම ගොස් ඇත.

2006 වර්ෂයේ දී රාජ්‍ය අංශයේ සේවක වැටුප් ප්‍රතිශෝධනයන් සිදු කරන ලද අවස්ථාවේ දී රාජ්‍ය සංස්ථා ගණයේ ආයතන වන සේවකයින්ගේ වැටුප් ප්‍රතිශෝධනය සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 සහ 30(1) නිකුත් කරනු ලැබුණි. ඒ අවස්ථාවේ දී සංස්ථා අංශයේ ඒ ඒ සේවායෝජක ආයතන ස්වකීය ආයතනයන්හි සේවය කරන සේවක පිරිස් පිළිබඳ ව තොරතුරු කළමනාකරණ සේවා දේපාර්තමේන්තුවට සපයා යෝග්‍ය නිර්දේශ ලබාදුන් විට වැටුප් ප්‍රතිශෝධනය සඳහා අවශ්‍ය තීරණයන් ඒ වෙතින් ලබා ගැනීම පිළිගත් ක්‍රියාවලියයි.

ශ්‍රී ලංකා පදනමේ සේවක විස්තර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට සැපයීමේ දී අධ්‍යක්ෂවරයාගේ ලේකම් තනතුර ඒ තොරතුරුවලට කවර හෝ හේතුවක් නිසා ඇතුළත් කර යවා නොතිබුණු බව පෙනී යයි.

එසේ එකී තනතුර පිළිබඳ විස්තර කළමනාකරණ දෙපාර්තමේන්තුවට නොයැවීමේ වගකීම සේවායෝජක ආයතනය වෙත පැවරේ.

ඒ හේතුව නිසා චක්‍රලේඛ අංක :30 ක්‍රියාත්මක වන අවස්ථාව වන විට මෙහි පළමුවැනි පාර්ශවයේ සහනය පතන ජයවර්ධන මහත්මියගේ තනතුරට අදාළ වැටුප් පරිමාණයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර එවා නැත. ඉන් අනතුරු ව සිදු ව ඇත්තේ ඒ වන විට ඇය ශ්‍රේණිගත කර තිබුණු 8 වන ශ්‍රේණියට ඇය ඇතුලත් නොකොට, ඊට වඩා එක් තලයක් ඇති 9 වන ශ්‍රේණියේ සභාපතිවරයාගේ ලේකම් තනතුරට අයත් වැටුප් පරිමානයට අනුකුල ව වැටුප් පරිවර්තනය කර ඇති බව පෙනී යයි. සේවකයින්ට වැටුප් තීරණය කිරීමේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ජයවර්ධන මහත්මිය දැරූ අධ්‍යක්ෂගේ ලේකම් තනතුරට සේවායෝජක ආයතනය වැටුප් පරිවර්තනය කර ගෙවා ඇත්තේ එබඳු අනුමැතියකින් තොර ව තම මනාපය පරිද්දෙනි.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමට පෙර පැවති වැටුප් ක්‍රම පදනම් වූ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25 ට අනුව ඉල්ලුම්කාරිය විසින් දරන ලද තනතුරට වැටුප් ගෙවා ඇත්තේ ඇය 8 වැනි ශ්‍රේණියට වර්ග කිරීමෙන් පසු ව රු. 16,625/= ක ආරම්භක වැටුපක් සහිත වැටුප් පරිමාණයට අනුව ය. එහෙත් කළමණාකරණ සේවා චක්‍රලේඛ 30 ක්‍රියාත්මක කිරීමේ දී ඇයගේ තනතුරට අදාළ වැටුප් පරිවර්තනය කර ඇත්තේ 9 වන ශ්‍රේණියට වර්ග කිරීමෙන් පසු රු. 13,425/= ක ආරම්භක වැටුප් සහිත වැටුප් පරිමාණයකට අනුව ය.

එමගින් සැබැවින් ඇය පිහිටුවිය යුතු වූ වැටුප් තලයේ නිසි පරිදි පිහිටුවා නැති බව පැහැදිලි ව පෙනේ.

ඉල්ලුම්කාරිය ශ්‍රේණියක් පහතට දැමීමේ හේතුවක් ලෙස පසු ව මතු වී ඇති කාරණයක් ලෙස බේරුම්කරණ විභාගයේ දී පෙන්වා සිටියේ ලේකම් ධුරයක් දැරීමට අනුමත බඳවා ගැනීමේ පටිපාටිය (Scheme of Recruitment) තිබිය යුතු අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් ඉල්ලුම්කාරිය විසින් සපුරා නොතිබූ බවයි. එසේ වුවත් යම් හේතුවක් පදනම් කරගෙන පෙර පැවැති අංක 25 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත වැටුප් සකස් කිරීමේ දී ඇය 8 වන ශ්‍රේණියේ වැටුප් තලයට පිහිටුවා ඇති බවත්, එය වැරදි සහගත ව සිදු ව ඇති බවත්, ඒ නිසා ඒ වන විටත් ඇය අතිරේක වැටුපක වාසියක් බුක්ති විඳ ඇති බවත් ය. ඒ කාරණය R5 ලෙස ලකුණු කරන ලද ජාතික වැටුප් සහ සේවක කොමිෂන් සභාවේ ලිපියෙන් ද තහවුරු වේ.

එය ඉල්ලුම්කාරියගේ වගකීමෙන් බාහිර කරුණකි. ලේකම් ධුරයක් දැරීමට ඇය අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණේ නම් 1976 අගෝස්තු මාසයේ සිට ඇය විවිධ අංශවල ලේකම් තනතුරු දැරුවේ කෙසේ ද යන්න ගැටළුවකි. A4 ලෙස ලකුණු කළ පත්වීම් ලිපිය මගින් රු. 11,545/= - 10 x 225 - 14,765/= ක් වූ නිශ්චිත වැටුප් පරිමාණයකට අයත් අධ්‍යක්ෂවරයාගේ රහස්‍ය ලේකම් තනතුරට ඇය පත් කොට ඇත. ඒ අනුව වැරදි වැටුපක් ඇය ලැබුවේ යයි අපට පිළිගැනීමට තරම් කරුණු මෙම පරීක්ෂණයේ දී ඉදිරිපත් වූයේ නැත. අනෙක් අතට එසේ වැරදි වැටුප් ගෙවීමක් දීර්ඝ කාලයක් සිදු වෙමින් පැවතියේ නම් එම කාරණය විගණන අංශ මගින් පෙන්වා දෙනු ලැබ ආපසු ඇයගෙන් අයකර ගැනීම සේවායෝජක ආයතනයේ වගකීමකි. එබන්දක් සිදු වී ඇති බවට පරීක්ෂණයේ දී කරුණු ඉදිරිපත් වුණේ නැත. මේ අවස්ථාවේ දී ඒ පිළිබඳ මැදහත් වීමක් බේරුම්කරණයට කළ නොහැක. බේරුම්කරණයේ වගකීම වන්නේ කාර්මික ආරවුලට අදාළ කාරණයෙන් ඉල්ලීම කරන සේවකයාට කිසියම් අසාධාරණයක් සිදු වී ඇත් ද? එසේ නම් ලබා දිය හැකි සහනය කුමක් ද යන්න තීරණය කිරීමයි.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ගොනු කළ අවසන් ලිඛිත සැලකිරීම්වල 3 වැනි පිටුවේ එසේ වැරදි ලෙස ගණනය කිරීමේ හේතුවෙන් වැඩිපුර වැටුප් ගෙවා ඇති තවත් සේවකයින් 16 දෙනෙකු සිටි බව කියැවේ. එසේ නම් ජයවර්ධන මහත්මියට පමණක් කළමනාකරණ චක්‍රලේඛ 30 ප්‍රකාර ව නිසි ශ්‍රේණියේ පිහිටුවා වැටුප් පරිවර්තනය නොකිරීම අසාධාරණ බවට නිගමනය කරමි.

තව ද නොයෙක් වර අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලුම්කාරියට සහනයක් ලබා දීම සඳහා තීරණ ගත් බවට කරුණු ඉදිරිපත් වීමෙන් පෙනී යන්නේ සේවායෝජක ආයතනයේ කළමනාකාරිත්වය පවා ඇයට සිදු වී ඇති අසාධාරණය පිළිගන්නා බවයි. මෙහි දී කළමනාකරණ චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කළ පසු ව සේවායෝජක ආයතනයෙන් ඉල්ලුම්කාරියට සිදු වී ඇති වරද නිවරදි කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට සහ ජාතික වැටුප් සහ සේවක කොමිෂන් සභාව වෙත තත්ත්වය වාර්තා කොට සහනයක් ලබාදීමට අනුමතිය ඉල්ලා යවා ඇතත් ඒ වෙතින් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බව දිගින් දිගට ම හුවමාරු වූ ලිපිවලින් පෙනී යයි. A9 වශයෙන් ලකුණු කොට පළමුවැනි පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද ජාතික වැටුප් සහ සේවක කොමිෂන් සභාවේ ලේකම් විසින් 2009.11.20 දිනැති ව ශ්‍රී ලංකා පදනමට එවන ලද ලිපියේ 5 වැනි ඡේදය මෙසේ ය.

''05. අධ්‍යක්ෂගේ ලේකම් තනතුරට වැටුප් ක්‍රමයක් ඔබේ ලිපියෙන් ඉල්ලා ඇත.''

සේවායෝජක ආයතනය, මෙම ඉල්ලුම්කාරියට අසාධාරණයක් වී ඇති බව පිළිගෙන එය නිවැරදි කිරීම සඳහා උපදෙස් පතා ඇති බව ද ඉන් මනා ව පැහැදිළි වේ. එම ලිපියේ 6 වැනි ඡේදයේ මෙසේ කියැවේ.

''06. *නව වැටුප් තීරණය කිරීම සඳහා මෙම කොමිෂන් සභාව වෙත සපයන ලද විස්තර ලේඛනයෙහි අධ්‍යක්ෂගේ ලේකම් තනතුරක් සඳහන් වී නොතිබුණු නිසා වැටුප් ක්‍රමයක් ලබා දී නැත. ඔබ ආයතනයේ සේවක මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණයේ දී මෙම තනතුරේ අවශ්‍යතාවය සලකා බලා වැටුප් ක්‍රමයක් ලබා දීමට සලකා බැලිය හැකි ය.*''

ජාතික වැටුප් සහ සේවක කොමිෂන් සභාව සේවායෝජක ආයතනයට 2009 වර්ෂයේ දී උපදෙස් දී ඇත්තේ ආයතනයේ සේවක මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කොට මෙම ඌණතාව මගහරවන ලෙසයි. එසේ ම A8 ලෙස ලකුණු කළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ආයතනයට එවන ලද ලිපියෙන් එම උපදෙස ම ලබා දී ඇත. නමුත් මෙම ඉල්ලුම්කාරිය විශ්‍රාම ගන්නා තෙක් සේවක මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කිරීමට අපොහොසත්වීම සේවායෝජක ආයතනයේ ප්‍රමාදයක් සහ අඩුපාඩුවක් බව පැහැදිළි කරුණක් වන අතර, ඒ ප්‍රමාදයේ අවාසිය ඉල්ලුම්කාරිය විඳ දරාගත යුතු යයි බලාපොරොත්තු විය නොහැකි ය.

ආරම්භයේ දී දෙපාර්ශ්වය ලබා දුන් ප්‍රකාශයන් ද, මෙම බේරුම්කරණ විභාගයේ දී මෙහෙයවන ලද සාක්ෂි ද, දෙපාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතඥවරුන් ඉදිරිපත් කළ අවසන් ලිඛිත සැළකිරීම් ද සැළකිල්ලට ගෙන යොමුවේ සඳහන් ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂගේ රහස්‍ය ලේකම් ලෙස සේවය කළ ජී. සී. එම්. ඒ. ජයවර්ධන මහත්මියට කළමනාකරණ චක්‍රලේඛ අංක 30 සහ 30 (1) අනුව නිසි පරිදි වැටුප් පරිවර්තනය නොකිරීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බවට තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කාරියට ලබා දිය යුතු සහනයන් ඇතුළත් පහත සඳහන් ප්‍රදනය පිළිගන්වමි.

ප්‍රදානය

1. පළමුවැනි පර්ශ්වයේ සහනය පතන ජී. සී. එම්. ඒ. ජයවර්ධන මහත්මිය කළමනාකරණ චක්‍රලේඛ අංක 30 හි ඇමුණුම්වල අඩංගු වන 8 වැනි ශ්‍රේණියට අයත් රු. 24,595/= වැටුප් තලයේ, එම චක්‍රලේඛය යටතේ වැටුප් පරිවර්තනයන් කළ දිනයට අදාළ ව පිහිටවිය යුතු ය.

2. එකී රු. 24,595/= වැටුප් තලයට අනුරූපී ව, එතැන් සිට ඇය විශ්‍රාම යන තෙක් කාලයට, කලින් කලට ලැබිය යුතු උසස්වීම් සහ අනෙකුත් වැටුප් පරිවර්තන ද සැලකිල්ලට ගනිමින්, වැටුප් ගණනය කොට හිඟ වැටුප් සේවායෝජක ආයතනය විසින් ගෙවිය යුතු ය.

3. එසේ ගණනය කරනු ලැබූ හිඟ වැටුප් පදනම් කරගෙන සේවක අර්ථසාධක අරමුදල, සේවක භාර අරමුදල සහ පාරිතෝෂික දීමනා සහ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම් ඇතොත් ඒවාට අදාළ මුදල් ද ගණනය කොට ජී. සී. එම්. ඒ. ජයවර්ධන මහත්මියට ගෙවිය යුතු ය.

4. ඉහත 1, 2 සහ 3 ප්‍රදනයන්හි සඳහන් හිඟ මුදල් ගණනය කොට අදල පරිදි ගෙවීම මෙම ප්‍රදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තුන් මසක් ඇතුලත සේවායෝජක ආයතනය විසින් සිදුකොට අවසන් කළ යුතු ය.

5. ඉහත 1, 2 සහ 3 ප්‍රදනයන්ට අදාළ ව එසේ ගණනය කරන ලද හිඟ මුදල් සහ ගෙවීම් ගෙවා අවසන් කිරීමෙන් පසු ව ජයවර්ධන මහත්මියගේ අත්සන ද සහිත ලේඛනයක් මගින් සහකාර කම්කරු කොමසාරිස් (මැද කොළඹ) වෙත දැනුම් දිය යුතු ය.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2022 පෙබරවාරි මස 25 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 04-0199/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.